

ලබන උඳුවප් පොහෝ දිනයෙන් මුනි සිරිපා සමය ඇරඹෙන වගයි

### ඎ බුදු පසේ බුදු හා මහ රහතුන්ගේ අතීන්ද්‍රිය ඥාන ශක්තිය ප්‍රබලයි

– පිටිදූවේ සිරිධම්ම හිමි

බුදු – පසේ බුදු – මහ රහතන් වහන්සේ තුළද ධ්‍යාන – භාවනා වැඩූ අය තුළද ඇතිවන සාමාන්‍ය ඉන්ද්‍රිය ශක්තිය ඉක්මවා යන අධි–මානසික ඥාණ විශේෂ පිළිබඳ පර්යේෂණ ප්‍රතිඵල සහ නූතන විද්‍යාව සමග අදාළ විෂය පිළිබඳ තුලනාත්මක විග්‍රහයක්ද ඇතුළත් ලිපි–යකි.

### ඎ සම්පත් හා ගුණ දම් වැඩීම දියුණු දිවියකට මඟ ය.

– ගොඩගම චන්ද්‍රදස්සී තෙරණිය

බුදු දහමේ දැක්වෙන – ලෞකික ජීවිතයේ දියුණුව සඳහා වූ මඟ, ධන පරිහරණය පිළිබඳ වැදගත් බොදු උපදෙස් ද – ඒ හා සම–ගාමීව මිනිස් සිතෙහි වැඩිය යුතු ගුණ දම් පිළිබඳ උනන්දුව පුද්ග–ලයාගේ සාර්ථකත්වයට බලපාන අන්දම ද මෙම ලිපියෙන් විව–රණය කැරේ.

### ඎ ත්‍රිවිධ රත්නයේ සාන්දෘෂ්ටික ඵල ප්‍රදර්ශනය කැරෙන ධම්මචේතිය සූත්‍රය

– කැටවල ඉන්දසාර හිමි

බුදු සසුනෙහි – ත්‍රිවිධ රත්නයෙහි උතුම් ගුණ සමුදය පළකැරෙන සූත්‍ර දේශනාවකට අර්ථ විවරණයක් සැපයීමට ගත් උත්සාහයකි.

### ඎ ප්‍රඥාව ජය මඟ පෙන්වයි

– දිවියාගහ යසස්සි නා හිමි

'සාර්ථක ජීවිතයකට ධම්ම පදයෙන්' විශේෂාංගය යටතේ ධර්මය තුළින් ප්‍රඥාව ලබාගැනීමේ වැදගත්කම. ප්‍රඥාවෙන් පිරිපුන් පුද්ග–ලයාට – මිනිස් සමාජය තුළ හිමිවන ශ්‍රේෂ්ඨත්වය.

### ඎ ධම්මපදය සිංහලයෙන්

– නුගවෙල පඤ්ඤාජෝති නා හිමි

'ධම්මපදය' නම් වූ ප්‍රකට බෞද්ධ ග්‍රන්ථයට සිංහල භාෂාවෙන් කරන ලද අනුවර්තනයක් – මෙවර බුදුසරණ පත්‍රයේ සිට කොටස් වශයෙන් පළ වේ. ධම්ම පදයේ ගාථා මුල සිට අනුපිළිවෙළින් එකින් එක සඳහන් කරමින් – ඒවායේ අර්ථ සරල සිංහල කවි මගින් පහදා දෙන රසවත් විශේෂාංගයකි.

### ඎ මංගල සූත්‍රයෙන් ගොඩනැගෙන මිනිස් පෞරුෂය

– සුගත් රත්හොට්ටි

මංගල සූත්‍රයෙන් ඉදිරිපත් වී ඇති යහපත් පිළිවෙත් – මිනිසාගේ ලෞකික දියුණුවට මෙන්ම විමුක්ති ප්‍රතිලාභයට ද බලපාන ආකා–රය පුද්ගල පෞරුෂය වර්ධනය කිරීමෙහිලා මංගල සූත්‍රයේ සඳහන් යහ පිළිවෙත්වල උපයෝගීතාව.

### ඎ පරිසරයේ සරණ නැතිනම් මිනිසා අසරණයි

– නිර්මලා අමරසිංහ

බුදුරජාණන් වහන්සේ – තමන්ගේ විවිධ දේශනා තුළින් පරිසරය රැකගැනීමේ වැදගත්කම ගැන පෙන්වා දී ඇති අයුරු. සොබා දහමේ සොබාව සහ නිවැරැදි පරිසර හිතකාමී පිළිවෙත් – උන්වා–හන්සේ තම දේශනා තුළින් ඉදිරිපත් කර ඇති අයුරු.

### ඎ කොළංකන්ද ගල් ලෙන් අරණ

– ජනක වෙත්තසිංහ

'සිත් සනසන සෙනසුන' විශේෂාංගය යටතේ කොළඹ දිස්ත්‍රික්කයට අයත් හබැල්ලට ආසන්න කළුඅග්ගල ප්‍රදේශයේ පිහිටි – ඉපැරැණි වන සෙනසුනක් පිළිබඳ තොරතුරු. බුදු සසුනේ අවසන් බුද්ධි මට්–ටම ලෙස සැලකෙන රහත් බවට පත්වූ භික්ෂූන් වහන්සේ වැඩ සිටි බවට විශ්වාස කැරෙන ලෙන් සහිත ආරණ්‍යයකි, මෙය.

## ⁜ ප්‍රිය වචන කතා කිරීම

– උඩුවේ ධම්මාලෝක හිමි

'දියුණුවේ දෙරටු' විශේෂාංගය යටතේ ප්‍රිය වචන කතා කිරීමෙහි වැදගත්කම. ලෞකික දියුණුව, සමාජය පිළිගැනීම, යහපත් මිතුරන් ඇසුරට ලැබීම ආදී වූ උසස් ප්‍රතිඵල රැසක් – ප්‍රිය වදන් භාවිතය තුළින් ලැබෙන අයුරු.

## ⁜ බාලයන් ඇසුර විපතකි; උතුමන් ඇසුර සැපතකි

– අඹේවෙල ධම්මපාල හිමි

ධර්මය වටහා ගත් – නුවණැ'ති පුද්ගලයන් ඇසුරු කිරීමේ වැද–ගත්කම හා නුවණ මඳ අය ඇසුරු කිරීමේ අවදානම. නිවන් මඟ යෑමට උනන්දුවක් දක්වන පුද්ගලයා උසස් බුද්ධියක් ඇති පුද්ගල–යන් ඇසුරු කිරීමේ වැදගත්කම.

## ⁜ අට ලෝ දහම

ආචාර්ය මැදගම වජිරඥාණ නාහිමි

ජීවිත යථාර්ථය පෙන්වන වැදගත් බෞද්ධ ඉගැන්වීමක් ලෙස සැල–කෙන'අට ලෝ දහම' පිළිබඳ විමසුමකි. සමාජ ජීවිතයක් ගත කරන සියලුදෙනා විසින් අත්දකිය යුතු ලෝක ධර්මතාඅටක් පිළිබඳ ඉදිරි–පත් වී ඇතිබුදු වදන් කිහිපයකට අර්ථ දැක්වීමකි.

## ⁜ සිතිවිලි උපදවා ගැනීමට හා පාලනයට බුදු දහම පෙන්වන මඟ

– අනගාරික ධර්මපාල

## ⁜ 'Dana Paramita' - Perfection of generosity

*-by Aryadasa Ratnasinghe*

## ⁜ අවි නැසුමට සවිය දෙන සාමය

– මිරිස්වත්තේ සුමන හිමි

ලෝකයෙහි සියලු අරගල වල මූලබීජය ඇත්තේ මිනිස් සන්තානය තුළ බව ද එබඳු වූ මිනිස් සිත ශාන්ත බවට පැමිණවීමට හේතු වන බුදු ඔවදන් වල වැදගත්කම ද විග්‍රහ කිරීමට දරන ප්‍රයත්නයකි.

## ⁜ සෝවාන් වීමට ධ්‍යාන – භාවනා අවශ්‍ය නැහැ

– බන්දුල සේනානායක

නිවන් මඟ ස්ථාවර වන පළමු කඩ ඉම වශයෙන් සැළකෙන 'සෝවාන්' නමින් දහමෙහි දැක්වෙන බුද්ධි මට්ටම ලබා ගැනීමට ප්‍රගුණ කළ යුතු පිළිවෙත පිළිබඳ සංවාදශීලී අදහසක් දැක්වෙන ලිපියක් හැටියට මෙය හැඳින්විය හැකිය.

## ⁜ නිවන් මඟෙහි පදනම: 'ශ්‍රද්ධා ගුණය'

– පොතුහැර විපස්සි හිමි

ජීවිතය පිළිබඳ සහ ජීවිතයෙන් විමුක්තිය ලද හැකි නිවැරැදි පිළි–වෙත පිළිබඳ – එම පිළිවෙතෙන් බැහැර නොවන තරමට ඇති වූ දැකීමක් සහ පැහැදීමක් ලෙසයි; ලේඛකයා මෙම ලිපියෙන් 'ශ්‍රද්ධාව' හඳුන්වන්නේ.

## ⁜ සදහම් දැනුම

– වහුමුවේ විජයවංශ නාහිමි

බුදු දහම සහ බුදු දහමට සම්බන්ධ අනෙකුත් විෂය කරුණු පිළිබඳ කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් විශේෂාංගයකි. දහම් අධ්‍යාපනය ලබන සිසුන්ට විශේෂයෙන් වැදගත්වන විශේෂාංගයක් ලෙස මෙය හැඳින්විය හැකිය.

## ⁜ බුදු දහම හා විද්‍යාව

– මහාචාර්ය ගාමිණී සේනානායක

ඉපැරැණි බෞද්ධ ඉගැන්වීම් කිහිපයක් නූතන විද්‍යාවේ සොයාගැනීම් සමඟ සසඳ බැලීමක් හැටියට මෙම ලිපිය හැඳින්විය හැකිය.